**2024-10-14 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

01. **77 වන නිදහස් දින සමරු උත්සවය**

2025-02-04 වැනි දිනට යෙදෙන 77 වන නිදහස් දින සමරු උළෙල පැවැත්වීමට අදාළව අවශ්‍ය මග පෙන්වීම සහ අධීක්ෂණ කටයුතු සඳහා ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ගරු අග්‍රාමාත්‍යතුමියගේ සහ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් යුත් අමාත්‍ය මණ්ඩල කමිටුවක් පත් කිරීමටත්, නිදහස් දින සමරු උළෙල අභිමානවත් ලෙස සංවිධානය කිරීමට හැකි වන පරිදි අදාළ වන්නා වූ සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය ඇතුළු සියලුම ආයතනවල ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් මෙහෙයුම් කමිටුවක් පත් කිරීමටත් අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අනුමත කරන ලදී.

02. **ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සතු ඉඩම් කොටසක් යෝජිත ඒකල ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත පවරා දීම**

ඒකළ සහ ඒ අවට ප්‍රදේශය තුළ පවතින ඉහළ විදුලි ඉල්ලුම අනුව අඛණ්ඩව විදුලිය සැපයීම මෙන්ම දැනට පවතින විදුලිබල පද්ධතියේ ගුණාත්මක බව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින්, ඒකල කර්මාන්තපුරය තුළ ග්‍රිඩ් උපපොළක් ඉදි කිරීමට යෝජනා වී ඇත. ඒකළ සැන්ඩ්ක්‍රොප් වත්තට යාබදව පිහිටි ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සතු අක්කර 10ක ඉඩමෙන් අක්කර 02යි රූඩ් 02ක ඉඩම් කොටසක් යොදා ගෙන එකී ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සුදුසු බවට හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, එකී ඉඩම් කොටස රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම වන රුපියල් මිලියන 320ක මුදල අය කරගෙන ලංකා විදුලිබල මණ්ඩලය වෙත පවරා දීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ජාතික ලේඛනාගාරයට අන්තර්ජාතික අධිලේඛන කවුන්සිලය මඟින් පිරිනැමෙන ප්‍රදානය**

අධිලේඛන පිළිබඳ දත්තානුදත්ත (Metadata) සහ ඩිජිටල් සංරක්ෂණය සඳහා Atom (Access to memory) සහ Archivematica යන විවෘත මූලාශ්‍ර මෘදුකාංග පිළිබඳ විශේෂඥයින් සම්බන්ධ කර ගනිමින් "ශ්‍රී ලංකාවේ ජාතික ලේඛනාගාරයේ Atom (Access to memory) සහ Archivematica යන මෘදුකාංග වේදිකා පිහිටුවීම" සඳහා යුරෝ 7,000ක ප්‍රදානයක් ලබා දීමට අන්තර්ජාතික අධිලේඛන කවුන්සිලයේ අන්තර්ජාතික අධිලේඛන සංවර්ධනය සඳහා වන අරමුදල එකඟතාව පළ කර ඇත. ජාතික ලේඛනාගාරයේ විශ්වාසදායක ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීම සඳහා දැනට ආරම්භ කර ඇති ව්‍යාපෘතියේ අදියර - 1 සඳහා වන පිරිවැයෙන් කොටසක් දැරීම පිණිස එකී ප්‍රදානය යොදා ගැනීම සඳහා අන්තර්ජාතික අධිලේඛන කවුන්සිලය එකඟ වී තිබේ. ඒ අනුව, එම ප්‍රදානය ලබා ගැනීම සඳහා වන ව්‍යාපෘති ප්‍රඥප්තිය අන්තර්ජාතික අධිලේඛන කවුන්සිලය සමඟ අත්සන් තැබීම සහ ඊට අදාළ අනෙකුත් පියවර ගැනීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **දේශීය නිෂ්පාදකයින්ගෙන් වෛද්‍ය සැපයීම් ප්‍රසම්පාදනය කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ කටයුතුවලට ප්‍රමුඛතාව ලබා දෙමින් දේශීය ඖෂධ නිෂ්පාදකයින් උනන්දු කරවීම සඳහා පසු මිල දී ගැනීමේ ගිවිසුම් (Buy Back Agreement) ක්‍රමවේදය යටතේ දේශීයව නිපදවන ඖෂධ මිල දී ගැනීම සඳහා 2013-11-29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමඟ ගිවිසුම්ගතව ඇති දේශීය ඖෂධ නිෂ්පාදන සමාගම්වල නිෂ්පාදනවලට වසර 15ක කාලයක් සඳහා පසු ගිවිසුම්ගත වීමටත්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට ලබා දෙනු ලබන ප්‍රමුඛතාව මත එම ඖෂධ මිල දී ගැනීමටත්, සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ දේශීය ඖෂධ නිෂ්පාදකයින් අතර ඖෂධ සැපයීම සඳහා වන පසු ගිවිසුම් අවුරුදු 10ක් දක්වා ක්‍රියාත්මක කිරීමටත්, 2018-10-02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, සපයනු ලබන ඖෂධවල මිල තීරණය කිරීම සඳහා මිල නියම කිරීමේ කමිටුවක් ද පත් කරනු ලැබ ඇත. එම ඖෂධ මිල දී ගැනීමේ ක්‍රමවේදය අනුව දැනට රටේ වෛද්‍ය සැපයීම් අවශ්‍යතාවයෙන් 20%ක් පමණ ආවරණය වන අතර, එම ප්‍රමාණය 40%ක් දක්වා වැඩි කිරීමේ හැකියාව පවතින බව හඳුනාගෙන තිබේ. ඒ අනුව, ඖෂධ ඇතුළුව වෛද්‍ය සැපයුම් 454ක් සැපයීම සඳහා හැකියාව පවතින

දේශීය ඖෂධ නිෂ්පාදන ආයතන 49ක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය මඟින් හඳුනාගනු ලැබ ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලියට මෙන්ම දැනටමත් පසු ගිවිසුම්ගත වී ඇති දේශීය ඖෂධ නිෂ්පාදන ආයතනවලට අගතියක් නොවන පරිදි, හඳුනාගනු ලැබ ඇති ආයතන වෙතින් වර්ෂයක කාලයක් සඳහා දේශීයව නිෂ්පාදනය කරනු ලබන ඖෂධ ඇතුළු වෛද්‍ය සැපයීම් සපයා ගැනීම පිණිස පසු මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹීම සඳහා සෞඛ්‍ය අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. 2024/25 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්/ආයතන සඳහා ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය**

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල් සහ අනෙකුත් ආයතන සඳහා ආරක්ෂක සේවා සැපයීම පිණිස සීමිත තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින්, සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම, සීමාසහිත එල්.ආර්.ඩී.සී.පුද්ගලික සමාගම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් ද, මධ්‍යම පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය සහ වයඹ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරිය වෙතින් අදාළ පළාත්වල පිහිටා ඇති සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට ගැනෙන රෝහල්/ආයතන සඳහා ලංසු කැඳවා ඇත. ඒ අනුව, සීමාසහිත එල්.ආර්.ඩී.සී.සේවා (පුද්ගලික) සමාගම විසින් සියලුම රෝහල් සඳහා ද මධ්‍යම පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය විසින් එම පළාතේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට ගැනෙන රෝහල් සඳහා ලංසු ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය සහ සෞඛ්‍ය අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, අදාළ ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව 2024-10-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06ක කාලයක් සඳහා සීමාසහිත එල්.ආර්.ඩී.සී.සේවා (පුද්ගලික) සමාගම වෙත පිරිනැමීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

06. **ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ඒකළ විකාශනාගාර ඉඩම පැවරීමෙන් ලද මුදල් යොදා ගනිමින් සංස්ථාවේ ඵලදායිතාව ඉහළ නැංවීම**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට අයත් ඒකළ විකාශනාගාරය පිහිටි ඉඩම රුපියල් මිලියන 1,286ක මුදලකට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරනු ලැබ ඇත. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ස්වයං මූල්‍ය උත්පාදන ආයතනයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා එම මුදල යොදා ගත යුතු බවට 2023-02-27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ තිබේ. එම මුදලින් රුපියල් මිලියන 525ක් මේ වන විට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වෙත ලැබී ඇති අතර, ඉන් රුපියල් මිලියන 205ක් සංස්ථා සේවකයින් සඳහා ක්‍රියාත්මක කරන ලද ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය සඳහා වැය කර ඇත. ඉතිරි මුදලින් රුපියල් මිලියන 145.72ක් යොදා ගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව නවීකරණයට අදාළ ක්‍රියාකාරකම් 25ක් ක්‍රියාත්මක කිරීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **විශේෂ කාර්ය බලකායේ කලපළුවාව විවාහක නිල නිවාස සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීම**

විශේෂ කාර්ය බලකායේ රාජකාරි කටයුතුවල නියුතු උප පොලිස් පරීක්ෂක නිලධාරීන් සඳහා විවාහක නිල නිවාස 15ක් සහ පොලිස් සැරයන්වරුන් හා පොලිස් කොස්තාපල්වරුන් සඳහා විවාහක නිල නිවාස 21ක් වශයෙන් නිල නිවාස ඒකක 36ක් කලපළුවාව ප්‍රදේශයේ ඉදිකිරීම පිණිස 2016-08-23 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අදාළ කොන්ත්‍රාත්තුව (බදු රහිත) රුපියල් මිලියන 289.59ක මුදලකට Construction Managers & Planers (Pvt) Ltd වෙත ප්‍රදානය කර තිබේ. ව්‍යාපෘති කාලසීමාව අවස්ථා කිහිපයකදී දීර්ඝ කර ඇති අතර, මේ වන විට ඉදිකිරීම් කටයුතුවලින් 95%ක් පමණ අවසන් කර ඇත. ඒ අනුව, ව්‍යාපෘති කාලසීමාව 2024-12-31 දින දක්වා දීර්ඝ කිරීමටත්, අමුද්‍රව්‍ය මිල ගණන් විශාල වශයෙන් ඉහළ යාම සහ රජය විසින් හඳුන්වා දෙන ලද බදු සංශෝධනයන්ගේ බලපෑම සැලකිල්ලට ගෙන ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 460.58ක් වශයෙන් සංශෝධනය කිරීමටත්, මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ලේකම් තනතුරෙන් ඉල්ලා අස්වීම

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ලේකම් තනතුරේ සේවය කළ ජනාධිපති නීතිඥ තිසත් දේවප්‍රිය බණ්ඩාර විජයගුණවර්ධන මහතා 2024-10-09 දින සේවයෙන් පසුව එම තනතුරින් ඉල්ලා අස්වීම සඳහා ලිපියක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, ඒ මහතාගේ ඉල්ලා අස්වීම පිළිගැනීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දෙන ලදී.

## 09. ආණ්ඩුවේ රස පරීක්ෂක තනතුර සඳහා පත් කිරීම

ආණ්ඩුවේ රස පරීක්ෂක තනතුරේ සේවය කළ දීපිකා සෙනෙවිරත්න මහත්මිය 2024-10-11 දින සිට විශ්‍රාම ලබා ඇත. ඒ අනුව පුරප්පාඩු වී ඇති එකී තනතුර සඳහා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුව මීළඟට ඉහළම ජ්‍යෙෂ්ඨතාව හිමි, දැනට ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක තනතුරෙහි සේවය කරනු ලබන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනි පතිරගේ සන්ධ්‍යා කුමුදුනී රාජපක්ෂ මහත්මිය පත් කිරීම පිණිස අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත්කිරීම

මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සැලකිල්ලට ගෙන, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරේ දැනට සේවය කරනු ලබන එච්.පී.සුමනසේකර මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය වෙත අනුයුක්ත කිරීමටත්, එම තනතුර සඳහා දැනට අතුණු පළාත් සභාවේ ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාමීය සංවර්ධන, සංස්කෘතික කටයුතු, සමාජ සුබසාධන හා පරිවාස ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික, නිවාස ඉදිකිරීම, නිවාස හා රැක් රක්ෂා අමාත්‍යාංශයේ ලේකම් ලෙස සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ඒ.බී.අයි. ද සිල්වා මහතා පත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**11. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය කිරීම පිණිස අවශ්‍ය වන ණය කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් මිල දී ගැනීම**

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත අනුව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් පිහිටුවිය යුතු වේ. එම පනතේ 23 වන වගන්තියේ විධිවිධාන පරිදි රාජ්‍ය ණය පිළිබඳ කාලානුරූප, විස්තරාත්මක හා නිවැරදි දත්ත හා තොරතුරු සුදුසු දත්ත පද්ධතියක පවත්වා ගත යුතුය. රජය විසින් මේ වන විට විදේශ ණය වාර්තාගත කිරීම සහ ණය කළමනාකරණය පිණිස පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙතින් ලබා දී ඇති Commonwealth Secretariat Debt Recording and Management System (CS-DRMS) පද්ධතිය යොදා ගනු ලබන අතර, එය විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කොට පවත්වාගෙන යනු ලැබේ. එම පද්ධතියේ යාවත්කාලීන කිරීම් සහ වාර්ෂික බලපත්‍රය දීර්ඝ කිරීම පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය විසින් මේ වන විට නවකා ඇත. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ තාක්ෂණික දූත මණ්ඩල සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර, පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන Commonwealth Meridian මෘදුකාංගය හෝ එක්සත් ජාතීන්ගේ වෙළෙඳාම සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය විසින් සපයනු ලබන DMFAS මෘදුකාංගය හෝ යොදා ගැනීම සුදුසු බව නිර්දේශ කරනු ලැබ තිබේ. ඒ අනුව, පිරිවැය වාසිදායක වීම, දත්ත සම්ප්‍රේෂණය පහසු වීම, ඒවායේ අඛණ්ඩතාව පවත්වා ගත හැකි වීම සහ පද්ධති අතර ඒකාග්‍රතාව තහවුරු කළ හැකි වීම යන හේතු මත පදනම්ව, පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලයෙන් Commonwealth Meridian මෘදුකාංගය මිල දී ගැනීම පිණිස යෝජනාවක් ලබා ගැනීමටත්, එකී යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවක නිර්දේශ ලබා ගැනීම සඳහා යොමු කිරීමටත් මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. ආර්ථික අර්බුදය හේතුවෙන් ධීවර කර්මාන්තයට ඇති වී තිබෙන බලපෑම අවම කර, ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ වැඩසටහන**

ඉන්ධන මිල ගණන් ඉතා විශාල ලෙස ඉහළ යාම හේතුවෙන් ධීවර කර්මාන්තයට සිදුවන අහිතකර බලපෑමට පිළියම් යෙදීම සඳහා 2024-08-21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණ ද, එම තීරණය මේ දක්වා ක්‍රියාත්මක වී නොමැත. එබැවින්, ධීවර කාර්මිකයින්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කර ගෙන 2024-10-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06ක කාලයක් සඳහා

පහත සඳහන් සහනයන් ලබා දීම පිණිස කෘෂිකර්ම, ඉඩම්, පශුසම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* ඉන්ධන වශයෙන් ඩීසල් ලබාගන්නා ධීවර යාත්‍රා හිමියන් සඳහා ඔවුන් විසින් ලබාගනු ලබන එක් ඩීසල් ලීටරයකට රුපියල් 25/-ක මුදලක් ලැබෙන සේ මසකට රුපියල් 300,000/-ක් දක්වා වන උපරිමයකට යටත්ව "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ දීමනාවක්" ලබා දීම.

* ඉන්ධන වශයෙන් භූමිතෙල් ලබාගන්නා යාත්‍රා හිමියන් සඳහා දිනකට භූමිතෙල් ලීටර 15ක හා මසකට දින 25ක උපරිමයකට යටත්ව, රැකියාවේ නිරත වන දිනයන් සඳහා පමණක් සීමා වන පරිදි භූමිතෙල් ලීටරයකට රුපියල් 25/-ක "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ දීමනාවක්" ලබා දීම.

* ඩීසල් හා භූමිතෙල්වල මිල සංශෝධනයන් සිදු කරනා සෑම අවස්ථාවකදීම ඩීසල් සඳහා උපරිම සහන මිල රුපියල් 250/-ක සීමාවකට ද භූමිතෙල් සඳහා උපරිම සහන මිල රුපියල් 150/-කට ද යටත්ව, උපරිම මාස 06ක කාලයක් දක්වා ඩීසල් සඳහා උපරිම වශයෙන් වෙළෙඳපොළ මිලෙන් 7.5%ක සහනයක් ද භූමිතෙල් සඳහා උපරිම වශයෙන් වෙළෙඳපොළ මිලෙන් 12.5%ක සහනයක් ද ධීවර ජනතාවට හිමි වන පරිදි මෙම වැඩසටහන පවත්වාගෙන යාම.

13. **ආහාර ප්‍රතිපත්ති කමිටුව - රැස්වීම් අංක 01**

ආහාර ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයකින් තොරව වෙළෙඳපොළට සැපයෙන බව තහවුරු කර ගැනීමටත්, ජීවන වියදම ඉහළ යාම හැකිතාක් දුරට පාලනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමටත්, සියලු පාර්ශ්වයන් සමඟ සම්බන්ධීකරණ ප්‍රවේශයක් අනුගමනය කරමින් යෝග්‍ය තීරණයන්ට එළඹීමටත් හැකි වන පරිදි 2022-10-03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ස්ථාපිත කරන ලද ආහාර ප්‍රතිපත්ති කමිටුව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විතව නැවත ස්ථාපිත කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

- ජනාධිපති ලේකම් - (සභාපති)
- අග්‍රාමාත්‍ය ලේකම්
- ලේකම්, මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
- ලේකම්, බලශක්ති අමාත්‍යාංශය
- ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
- ලේකම්, අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
- ලේකම්, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා, සමුපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
- ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
- ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
- ලේකම්, පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

14. **විශ්‍රාමිකයින්, වී ගොවීන් සහ ධීවර කාර්මිකයින් වෙත සහන සැලසීම**

සියලුම විශ්‍රාමිකයින් සඳහා රුපියල් 3,000/-ක මාසික අන්තර්කාලීන දීමනාවක් ලබා දීමටත්, 2024/25 මහ කන්නයේ වී වගා කරන ගොවීන් වෙත හෙක්ටයාරයකට රුපියල් 25,000/-ක් බැගින් හෙක්ටයාර 2ක උපරිමයක් දක්වා පොහොර සහනාධාරය වැඩි කර ලබා දීමටත්, ධීවර යාත්‍රා හිමියන්ට මූල්‍ය සහායක් ලබා දීමටත් ගනු ලැබ ඇති අමාත්‍ය මණ්ඩල තීරණයන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය වන ප්‍රතිපාදන, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන යටතේ වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදන තුළින් සුදුසු පරිදි කළමනාකරණය කර ගැනීම සඳහා මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********